
## ඉහල ඇළහැර ඇළ සිතියම



## පරිසරයටත් අවධානය ..........

මෙම දැවැන්ත සංවර්ධන ව්‍යාපෘතියෙහි තිරසාරබව තහවුරුකරමින්, සංවර්ධන ඉලක්කයන් කරා ළඟාවීමේ අරමුණින් සැලසුම්කරණ අවධියේ පටන් "පාරිසරික සාධක" පුළුල් ලෙස පදනම් කරගනු ලබයි. එමෙන්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මකවන අවධියේදී පරිසර කළමනාකරණ කටයුතු නිසිලෙස මෙහෙය වීම සඳහා "පරිසර සුරක්ෂිතතා ඒකකයක්" ස්ථාපනය කරනු ලැබේ. ව්‍යාපෘතිය මඟින් පරිසරයට සිදුවන බලපෑම් අධ්‍යනයකර,මධ්‍යම පරිසර අධිකාරියෙ හි අනුමැතියද ආසියානු සංවර්ධන බැංකුවෙ හි (පරිසර සුරක්ෂිතතා ප්‍රතිපත්ති ප්‍රකාරව) අනුමැතියද ව්‍යාපෘතියට ලබාදී ඇත.

වන ගොමු, සතා සිවුපාවන් වෙසෙන පරිසර පද්ධතීන් සේම, ගම් නගර ඇතුළත් මානව පරිසරයටද සිදුවිය හැකි අහිතකර බලපෑම් මඟහරවා ගැනීම සඳහා පහත සඳහන් ප්‍රධාන ක්‍රමෝපායන් පරිසර සුරක්ෂිතතා ඒකකය මගින් ක්‍රියාත්මක කෙරේ.

- සමාජ හා පාරිසරික ගැටලු, ඉදිකිරීම් ආශ්‍රිත පරිසර දූෂණ වැනි ගැටලු ආදිය විසඳීමේ ක්‍රමයක් මඟින් ව්‍යාපෘතිය ආශ්‍රිතව පාරිසරික ගැටලු ප්‍රශස්ත ලෙස නිරාකරණය කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම
- අලි මිනිස් ගැටුමටද විසඳුම් සහිත "වනජීවි කළමනාකරණ සැලැස්මක්" විද්වත් මඩුල්ලක් මගින් සම්පාදනයකර ක්‍රියාත්මක කිරීම
- පරිසර අනුමැතීන්ට අදාලව සියලු කොන්දේසි සහ වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ප්‍රදේශීය සභාව වැනි ආයතන මඟින් අනුගමනය කරනු ලබන නීති සහ උපමානයන් ප්‍රකාරව ව්‍යපෘති කටයුතු මෙහෙයවීම කරනු ලැබේ.

## සමාජ බලපෑමට ආරක්ෂණයක්.......

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී නව ඇළ මාර්ග ඉදිකිරීම සඳහා භූමිය අත්පත්කර ගැනීමට සිදු වේ. එමෙන්ම ඇතැම් නිවාසවලට හා දේපලවලට බලපෑම් ඇතිවිය හැක.

මෙම සිදුවන සමාජ බලපෑම පිළිබඳව ව්‍යාපෘතිය සිය සමාජ ආරක්ෂණ වැඩසටහන යටතේ අවධානය යොමුකර සිදුවිය හැකි බලපෑම ගණනයකර නිසි පරිදි වන්දි ප්‍රධානයන් ලබාදීමටද, අවශ්‍ය අය සුදුසු ස්ථානයන්හි නැවත පදිංචි කරවීමට අවශ්‍ය පහසුකම් සැපයීමට හෝ වෙනත් සුදුසු විකල්ප ක්‍රියාත්මක කිරීමටද සැලසුම්කර ඇත.

### ඔබටත් වගකීමක්.....

**මහවැලි සංවර්ධනයේ ප්‍රතිලාභ අප දුවා දරුවන්ටද ලැබීමට ඉඩ සලසා ඔවුන්ට පහසුවෙන් ජීවත්විය හැකි පරිසරයක් නිර්මාණය කිරීමට දායකවීම අප කාගේත් කාලීන වගකීමක් වන්නේය**

**ඉහළ ඇළහැර ඇළ ව්‍යාපෘතිය**
**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, මඩාටුගම**
**දුරකථන - 0253248604**
e-mail - uecp.mwsip@gmail.com

MWSIP

MWSIP Leaflet No 04 : October, 2016




# MWSIP

**මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන**

**මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය**

MWSIP

# මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන

එක්දහස් නවසිය හැටේ දශකයේ ආරම්භකර විවිධ අදියරයන් යටතේ ක්‍රියාත්මක කරනලද මහවැලි මහා සැලැස්ම ප්‍රකාරව යෝජිතව තිබූ බොහෝ ව්‍යාපෘති, මේ වනවිට ක්‍රියාත්මක කර එහි ප්‍රතිලාභ ජනතාව අතරට පත්වෙමින් තිබේ. **මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනද** මහවැලි සංවර්ධන වැඩපිළිවෙලෙහි අවසන් අදියරයට යෝජිත වූ ප්‍රධාන වැඩසටහනකි.

මෙමඟින් දැනට ඉදි කරමින් පවත්නා “මොරගහකන්ද - කළුගඟ” ජලාශවලින් හා යාබද ගංගා ද්‍රෝණිවලින් ලැබෙන්නා වූ අතිරික්ත ජල සම්පතෙන් කොටසක් උතුරු මැද හා වයඹ පළාත්වලට ලබාදීමට සැලසුම්කර ඇත. දැනට දෙකන්නයේ වගා කටයුතු කිරීමට නොහැකිව උග්‍ර වාරි ජල හිඟයෙන් හා පානීය ජල හිඟයෙන් පීඩාවිඳින එකී පළාත්වල ජනතාවගේ මූලික ජල අවශ්‍යතා සපුරා ඔවුන්ගේ ජීවන තත්වය නංවාලීම වැඩසටහනේ මූලික අපේක්ෂාව වේ.

**ආසියානු සංවර්ධන බැංකුව හා ශ්‍රී ලංකා රජය** එක්ව සපයන රුපියල් බිලියන 90ක මූල්‍ය පහසුකමක් යටතේ මෙම ආයෝජන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැළසුම්කර ඇත. වැඩසටහන යටතේ ප්‍රධාන ව්‍යාපෘති තුනක් ක්‍රියාත්මක කරනු ලබයි. එනම්,

- **ඉහළ ඇළහැර ඇළ ව්‍යාපෘතිය**
- **වයඹ පළාත් ඇළ ව්‍යාපෘතිය**
- **මිණිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය**



## ඉහළ ඇළහැර ඇළ ව්‍යාපෘතිය

ඉහළ ඇළහැර ඇළ ව්‍යාපෘතිය මාතලේ, පොලොන්නරුව හා අනුරාධපුරය යන දිස්ත්‍රික්ක තුළ පැතිරී ඇත. ව්‍යාපෘතිය යටතේ කළුගඟ ජලාශයේ සිට මොරගහකන්ද ජලාශය දක්වා අලුතින් ඉදිකරනු ලබන උමං ඇළද සහිත ඉහළ ඇළහැර ඇළ මාර්ගය ඔස්සේ මානන්කට්ටිය වැව, ඊරුවැව,හුරුළු වැව හා මහකනදරාව වැව දක්වා ජලය ගෙනයාමට අවශ්‍ය ඉදිකිරීම් සිදුකරනු ලැබේ.
මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 65,000ක් ඇස්තමේන්තුකර ඇති අතර එය 2016 වසර අග සිට 2022 දක්වා ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

## ව්‍යාපෘතිය අදියරයන් තුනකින්

ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ පහසුව සඳහා එය මූලිකාංග තුනකට සැලසුම්කර ඇත එනම්,

- කළු ගඟ ජලාශයේ සිට මොරගහකන්ද ජලාශයට ජලය රැගෙන යාම සඳහා උමං සහිත ඇළ මාර්ගය ඉදිකිරීම.
- මොරගහකන්ද සිට හුරුළු වැව දක්වා ජලය රැගෙන යාම සඳහා ඉහළ ඇළහැර ඇළ මාර්ගය ඉදිකිරීම.
- මානන්කට්ටිය වැව,ඊරු වැව හා මහකනදරාව වැව්වලට ජලය ගෙනයන වාරි පද්ධතිය වැඩි දියුණු කිරීම.



## ව්‍යාපෘතිය යටතේ සිදුකරන කාර්යයන්

- උතුරු මැද පළාත් ඇළ සඳහා ජල පාලන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.
- කළු ගඟ ජලාශයේ සිට මොරගහකන්ද ජලාශය දක්වා ජලාශ දෙක යා කරමින් උමං මාර්ගද සහිත ඇළ මාර්ගයක් ඉදිකිරීම.
- මොරගහකන්ද ජලාශයේ සිට හුරුළු වැව දක්වා ඉහළ ඇළහැර ඇළ කි.මී 65ක් දිගට ඉදිකිරීම. මෙහිදී එහි පළමු කි.මී 27 විවෘත හා සංවෘත කොටස්වලින් සමන්විත කොන්ක්‍රීට් ඇළක් ලෙස ඉදිකිරීම.
- කි.මී 27 සිට කි.මී 55 සීමාව දක්වා ඉහළ ඇළහැර ඇළ උමඟක් ලෙස ඉදිකිරීම.
- උමඟ අවසානයේ සිට කි.මී.65 සීමාව දක්වා කොන්ක්‍රීට් ඇළ මාර්ගය නැවත ඉදිකර,යකල්ල ප්‍රදේශයේ ත්‍රී බෙදුමකින් පහත ප්‍රදේශ හා වැව්වලට ජලය සැපයීමට අවකාශ සැලසීම.
- යකල්ල සිට ගලෙන්බිඳුණුවැව, කහටගස්දිගිලිය, හොරොව්පතාන, මැදවච්චිය, කැබැතිගොල්ලෑව ප්‍රදේශවලට ජලය සැපයීම සඳහා ඉදිරියේදී ඉදිකිරීමට යෝජිතව ඇති උතුරු මැද පළාත් ඇළ සඳහා ජල හැරවුමක් ඉදිකිරීම.
- හුරුළු වැවට හා ඒ ආශ්‍රිත වැව්වලට ජලය සපයන ජල හැරවුම ඉදිකිරීම.
- යකල්ල සිට මානන්කට්ටිය වැව තෙක් කි.මී 6 දිග ඇළක් අලුතින් ඉදිකර මානන්කට්ටිය වැවටද එතැන් සිට පවතින ඇළ මාර්ග කි.මී 23ක් දිගට දියුණු කිරීම මගින් ඊරු වැව හරහා මහකනදරාව හා නාච්චාදුව වැව්වලටද ජලය සැපයීම

## ව්‍යාපෘතියෙන් ලැබෙන ප්‍රතිලාභ..........

- හුරුළුවැව, මානන්කට්ටිය වැව, ඊරුවැව හා මහකනදරා වැවට අඛණ්ඩ ජල සැපයුමක් ලබාදීම තුළින් එම වැව් නිසි ලෙස පෝෂණයකර මෙම වැව් යටතේ වූ ගොවි බිම්වල යල-මහ දෙකන්නයේම වගාකල හැකිවීම.
- ව්‍යාපෘතිය හේතුවෙන් ප්‍රතිලාභී ගොවි ජනතාවද ඇතුළුව පවුල් විසිපන්දහසකට පමණ සෙත සැලසීමට හැකිවීම.
- මහකනදරාව වැවට ජලය සැපයෙන හෙයින් ඒ යටතේ ක්‍රියාත්මක වීමට නියමිත අනුරාධපුර උතුරු පානීය ජල ව්‍යාපෘතිය ආරම්භ කිරීම පහසු වීමද ඇතුලුව ජනතාවගේ පානීය ජල හිඟයට පිළියම් ලබාගත හැකිවීම.
- ප්‍රදේශයේ භූගත ජල මට්ටම ඉහළ යාම ශාක ප්‍රජාවට හිතකර වීම හා ජනතාවට ළිං ජලය භාවිතයට ඉඩ සැලසීම.
- නව ඇළ මාර්ග ඉදිවීම හේතුවෙන් ව්‍යාපෘති ප්‍රදේශයේ හා අවට ප්‍රජාවට ප්‍රයෝජන ගණනාවක් වක්‍රව ලබාගත හැකි වීම සහ ඉදිකිරීම් අවධියේදී ජනතාවට රැකියා අවස්ථා ඇතිවීම.